ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක **2412/30 - 2024** නොවැම්බර් මස **29** වැනි සිකුරාදා **- 2024.11.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2021/115.

කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.02.02 දිනැති හා අංක 2317/66 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2023.01.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නත්තරම්පත, පන්සල් වත්ත, අංක 21 හි පදිංචි ආර්.විශාකා කාන්ති මිය ඇතුළු සේවකයින් 16 දෙනා සහ කොළඹ 13, බ්ලූමැන්ඩල් පාර, අංක 223 හි පිහිටි සිලෝන් වොක්ලට්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/22/2023 හා 2024.10.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 නොවැම්බර් මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

1A - G 043141 - 18 (2024/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාබාවේදී ය.

(බේරුම්කරු- ටී.සී.ජේ. පීරිස්)

ආර්. විශාකා කාන්ති මිය ඇතුළු සේවකයින් 16 දෙනා
අංක 21, පන්සල් වත්ත,
නත්තරම්පොත.

පළමු වන පාර්ශ්වය

ගොනු අංකය : IR/COM/03/2021/115
නඩු අංකය : A/22/2023

එරෙහිව

1. සිලෝන් චොක්ලට්ස් ලිමිටඩ්,
අංක 223,
බ්ලූමැන්ඩල් පාර,
කොළඹ 13.

දෙවන පාර්ශ්වය

වර්ෂ 2024 ක් වූ ඔක්තෝම්බර් මස 01 වන දින දීය.

ප්‍රදානය: කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරි ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පරිදි කම්කරු ආරාවුලට හේතු වී ඇති කරුණ වනුයේ

"ආර්.විශාකා කාන්ති මිය ඇතුළුව පහත නම් සඳහන් සේවකයින් 16 දෙනාට විශ්‍රාම යන සේවකයින්ට වර්ෂයකට මසක වැටුප පදනම් කරගෙන පාරිතෝෂික දීමනා ගෙවීමේ ක්‍රමය වෙනස් කර වර්ෂයකට මාස භාගයක වැටුප පදනම් කර පාරිතෝෂික දීමනා ගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේද, යන්න හා එසේ අසාධාරණයක් සිදු වුයේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳ වේ. "

01.ආර්. විශාකා කාන්ති	09.ඊ. ආර්. එල්. ගුණසේකර
02. ඩී. එම්. සී. පී. දිසානායක	10.කේ.එම්.ඩබ්. යටවර
03. අයි. එම්. විජිතා කුමාරි	11.කේ.ඒ. සුනිල්
04.පී. එච්. උපාලි රණතුංග	12. ජේ. එම්.පුෂ්පලතා
05.එච්.එම්. ජේ. මැණිකේ	13. ඩබ්. එම්. බී. විජේතුංග
06. එම්. පී. දයානි පෙරේරා	14. ඩී. එම්. චන්ද්‍රා කුමාරි
07.ඊ.සී.එස් පෙරේරා	15.ඩී.එම්.ඩබ්. රණතුංග
08. එච්.ජී.අමරසීලි	16. එම්. ජී. පී.ඩී. කුමාරි

ප්‍රදානය

මෙය බේරුම්කරණය කර නිරවුල් කිරීම සඳහා කරුණු විමසීමට කැඳ වූ අවස්ථාවේ ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ කේ.පී.ජී.ප්‍රේමදාස මහතා ද, දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ඉල්හාම් කාරියප්පර් මහතා සමඟ නීති නිළධාරිනී විජිනි දිසානායක මහත්මිය සහ ආයතනයේ නියෝජිතයෙක් පෙනී සිටී.

මෙහිදි පළමුව මෙම කරුණ සම්බන්ධයෙන් සමථයක් තිබේදැයි විමසා සිටින ලදී. එහිදී පළමු පාර්ශ්වය විසින් ඔවුන් සමථයකට විරුද්ධත්වයක් නොමැති බව ප්‍රකාශ කර සිටි අතර දෙවැනි පාර්ශ්වය විසින් සමථයක් දැනට නොමැති බවත්, ඉල්ලුම්කාර පාර්ශ්වයේ සමහර ඉල්ලුම්කරුවන් පාරිතෝෂික ගෙවූ බවට පිළිගෙන ලිපිවලට අත්සන් කර ඇති බවත් ප්‍රකාශ කරමින් සමථයක් තිබේදැයි ඊලඟ දිනයේ ප්‍රකාශ කරන බවත්, දන්වා සිටින ලදී. දෙපාර්ශ්වයම පලමු හා දෙවන ප්‍රකාශ ලබාදීමෙන් පසු විමසීමට තැබීමට පෙර සමථය සම්බන්ධයෙන් කරුණු විමසීමේදී දෙපාර්ශ්වය විසින් යෝජනා කරන ලද සමථ කොන්දේසිවලින් සමථයක් කරා එළඹීමට නොහැකි වීම මත විමසීමට තබන ලදී.

දෙවන පාර්ශ්වය විසින් විමසීම ආරම්භ කිරීමට ප්‍රථමව මූලික විරෝධතාවයක් එනම් ඉල්ලුම්කරුවන් දොළොස් දෙනෙකු පාරිතෝෂික ලබාගෙන වෙන කිසිම ගෙවීමක් නොමැති බවට අත්සන් කර ඇති බවත්, එම නිසා "Estoppel" සංකල්පය යටතේ ඔවුනට තවදුරටත් වැඩිපුර දීමනාවක් ලබා ගැනීමට හිමිකමක් නොමැති බවට ගෙනෙන ලද විරෝධතාවය සම්බන්ධයෙන් දෙපාර්ශ්වයේම කරුණු විමසීමෙන් අනතුරුව එකී විරෝධතාවය සම්බන්ධයෙන් නඩුවේ සාක්ෂි මෙහෙයවීමෙන් අනතුරුව සලකා බලන බවට දන්වා සිටින ලදී.

මෙහිදී පිළිගැනීම් වශයෙන්,

සියළුම ඉල්ලුම්කරුවන් සිලෝන් චොක්ලට් ලිමිටඩ් ආයතනයේ සේවකයන් බව ද, ඔවුන් සියළු දෙනා සේවය අවසන් කර ඇති බවද, සියළුම ඉල්ලුම්කරුවන්ට ඔවුන්ගේ සේවා කාලය ට වර්ෂයකට මාස 1/2 ක් වැටුප් බැගින් දෙවන පාර්ශ්වය විසින් ගෙවා ඇති බවත්, දෙපාර්ශ්වය විසින් පිළිගන්නා ලදී.

ඉහත පිළිගැනීම් මත පළමු පාර්ශ්වය විසින් ඉල්ලා ඇති පරිදි ඔවුන්ට හිමිවිය යුතුයැයි සඳහන් කරන ඉතිරි මාස 1/2 ක වැටුප ලැබිය යුතුදැයි තීරණය කිරීම සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු නිගමනයකට එළැඹීමට හැකිවන පරිදි පළමු පාර්ශ්වයට නියමිත සාක්ෂිකරුවන් කැඳවන ලෙසට දන්වා සිටින ලදී. ඒ අනුව පළමුව පලමු පාර්ශ්වය වෙනුවෙන් ආර් විශාකා කාන්ති නැමැති තැනැත්තිය සාක්ෂි දීම සඳහා කැඳවන ලදී.

ඇයගේ සාක්ෂිය අනුව ඉල්ලුම්කාර සේවකයින් 16 දෙනා, පළමුව මහනුවර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට තම ඉල්ලීම ඉදිරිපත් කල බවත්, පසුව එමඟින් කාර්මික සබඳතා අංශයට යොමු කොට ඉන්පසු මෙම ප්‍රශ්නගත කරුණු සම්බන්ධයෙන් බේරුම්කරණය සඳහා යොමු කොට ඇත. මෙම සාක්ෂිකාරිය බේරුම්කරණය ඉදිරියේ සාක්ෂි දෙමින් ඇය දෙවන පාර්ශ්වයට අයත් ආයතනයේ අවුරුදු 33 ක් සේවය කොට විශ්‍රාම ගිය බවත්, රැකියාවෙන් විශ්‍රාම යාමෙන් අනතුරුව පාරිතෝශිකය වශයෙන් සේවා කාලය අවුරුද්දකට මාස 1/2 ක වැටුප බැගින් මුදලක් ලැබුන බවත්, නමුත් මීට පෙර විශ්‍රාම ගත් අයට අවුරුද්දට මසක වැටුප බැගින් මුදලක් ලබා දී ඇති බවත්, කියා සිටියාය. එසේ මසක වැටුප් ගෙවීම් ලබාගත් අයගේ නම් ද ඉදිරිපත් කරන ලදී. එසේම දෙවන පාර්ශ්වය කියන පරිදි මාස 1/2 බැගින් ගණන් බැලූ පාරිතෝෂිකය නීත්‍යානුකූල පාරිතෝෂිකය විදිහටද, ඉතිරි ගෙවීම් ත්‍යාගයක් ලෙස ගෙවූ බවට කරනු ලබන ප්‍රකාශය අමූලික බොරුවක් බව ද කාලාන්තරයක් තිස්සේ සියලු මුදල් ලැබුනේ පාරිතෝශිකයක් විදිහට බවත් සාක්ෂිකාරිය විසින් ප්‍රකාශ කරන ලදී. දෙවන පාර්ශ්වය විසින් මෙම සාක්ෂිකාරීය ගෙන් අසන ලද හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ප්‍රකාශ කර සිටියේ දැනට ඇගේ පාරිතෝෂික මුදල අවස්ථා හතරක දී ගෙවූ බවත් එකී පළමු අවස්ථා තුනම සම්බන්ධයෙන් ලිපි වලට අත්සන් තැබූ බවත්, හතරවන අවස්ථාවේ ලබාදුන් ලිපිය අත්සන් කිරීමට ප්‍රතික්ෂේප කල බවත්ය. එකී ලිපියේ සඳහන්ව තිබුණේ සම්පූර්ණ මුදල ලබාගත් බවට අත්සන් කිරීමට නිසා තමා එය ප්‍රතික්ෂේප කරන ලද බවත්, එකී මුදල සඳහන් චෙක්පත ලබා නොගත් බවත්, ඇය විසින් ප්‍රකාශ කරන ලදී. පසුව දෙවන පාර්ශ්වය විසින් මෙම චෙක්පත ඇයගේ ගිණුමට බැර කර ඇති බව, පිළිගන්නා ලදී. ඒ අනුව ඇයට ලැබිය යුතු පාරිතෝෂිකයේ හරි අඩක් ලැබී ඇති බව ප්‍රකාශ කරයි.

එසේම මෙම සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී දෙවන පාර්ශවය විසින් V - 2 ලෙස ලකුණු කරන ලද ලේඛනය මඟින් ඇයගේ බැංකු ගිණුමට බැරකර ඇති එකී ප්‍රතික්ෂේප කරන ලද මුදල දෙවන පාර්ශ්වය විසින්ද තහවුරු කරන ලදී. තවද දෙවන පාර්ශ්වය විසින් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් 2015 න් පසු ආයතනයට මුදල් ප්‍රශ්න, එනම් ආයතනයේ ආර්ථික මට්ටම හොඳ නැති වූ බවට කල ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන බවත් ඔවුනට පඩි වැඩි කල බවත්, OT (අතිකාල දීමනා) ගෙවූ බවත්, ගොඩනැගිලි හැදූ බවත්, බෝනස් ලබාදුන් බවත්. ප්‍රකාශ කරන ලදී. ඒ කාල සීමාව තුල විශාල පිරිසක් විශ්‍රාම ගිය බවත්, එම හේතුව මත පාතෝෂික දීමනාව ටිකෙන් ටික ගෙවූ බවත් සාක්ෂිකාරිය තවදුරටත් ප්‍රකාශ කරන ලදී. හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඇය වැඩිදුරටත් ප්‍රකාශ කරන ලද්දේ ඔවුනට පාරිතෝෂිකය ගණනය කිරීමේදී සේවා කාලය වර්ෂයකට මාස 1/2 මුදලක් බැගින් ගෙවූ බවත්, මින් පෙර සියලු දෙනාට ගෙවූ පරිදි ඉතිරි මාස 1/2 ද ඔවුනට ද ලබා දෙන ලෙසත්ය.

මෙම සාක්ෂිකාරියගේ සාක්ෂි විමසීම අවසන් කිරීමෙන් අනතුරුව එකී පැමිණිල්ලේ ලේඛනයේ 10 වෙනියට නම සඳහන් වන කේ.එම්.ඩබ්ලිව්. යටවර මහතා සාක්ෂියට කැඳවන ලදී.

ඔහු විසින් ප්‍රකාශ කරන ලද්දේ දෙවන පාර්ශ්වය විසින් බේරුම්කරණ තීන්දුවක් හෝ සාමූහික ගිවිසුමක් හෝ වෙනයම් එකඟතාවයක් නොමැතිව සහ, ආර්ථික අපහසුතා නිසා ගෙවීමට නොහැකි බවත් යෝජනා කර ඇතත් වැඩි වාසිදායක පාරිතෝෂිකයක් දීර්ඝ කාලයක සිට ගෙවා ඇති නිසා ලිඛිත නොවන ව්‍යංග ගිවිසුමක් සේවකයින් හා සමාගම අතර, ක්‍රියාත්මක වී තිබූ බවත්ය. එසේම එය මූල්‍ය වාර්තා වල ද සඳහන් වී ඇති බවත්, දීර්ඝ කාලයක් තිස්සේ වර්ෂයකට මාසය බැගින් ගණන් බලා පාරිතෝෂිකය ගෙවා ඇති බවත්, දෙපාර්ශ්වය අතර ව්‍යංග ගිවිසුමක් පැවති බවටත් සාක්ෂි ලබා දෙන ලදී. තවද සමාගමේ ආර්ථික අපහසුතාවයක් පැවති බව පිළි නොගන්නා බවද, එයට උදාහරණ වශයෙන් අවුරුද්දකට බෝනස් දෙක බැගින් ලබාදුන් බවත්, වාර්ෂිකව වැටුප් වැඩිකල බවත්, වර්ෂයක් පාසා යන්ත්‍ර සූත්‍ර ආනයනය කල අතර කෝටි 25 ක් දී යන්ත්‍රයක් ආනයනය කල බවත්,

2020 වර්ෂයේ ඉතිහාසයේ හොඳම අලෙවි වාර්තාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සහ කට්ටිය එකට ගත් ඡායාරූප පවා තිබෙන බවත් මේ කරුණු මත සමාගමට කිසිදු ආර්ථික අපහසුතාවක් නොමැති වූ බවටත්, සාක්ෂි දෙන ලදී. (මේ කිසිදු සාක්ෂියක් බිඳහෙළීමට දෙවන පාර්ශ්වයට නොහැකි වී ඇති බව මා නිගමනය කරමි).

ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා සමඟ කරන ලද සාකච්ඡාවකින් එම පුද්ගලයන් වෙන් වෙන්ව මේ ප්‍රශ්නගත මුදල් ගෙවීමට එකඟ වූ බවට හඬ පටයක් මෙම සාක්ෂිකරු මාර්ගයෙන් ඉදිරිපත් කිරීමට සූදානම් වූ අවස්ථාවේ එයට දෙවන පාර්ශ්වය විසින් විරුද්ධතාවය ප්‍රකාශ කරන ලදී. ඉල්ලුම්කාරිය විසින් ඉදිරිපත් කර ඇති පළමු ප්‍රකාශයේ එවැනි හඬ පටයක් ගැන කිසිදු දැනුම්දීමක් කර නොමැති නිසාත් එම හඬපටයේ නිරවද්‍යතාව පිළිබඳව ගැටලු ඇති බව පෙනීගිය නිසාත් එම හඬපටය ඉදිරිපත් කිරීම මා විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

දෙවන පාර්ශ්වය විසින් යටවර මහතාගෙන් අසන ලද හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඔහු ප්‍රකාශ කර සිටියේ සාක්ෂිකරු සේවය කල අවුරුදු 30 ක කාලය තුලදී කිසිදු ගැටළුවක් ආයතනය සමඟ නොතිබූ බවත්, විශ්‍රාම යන විට උත්සවයක් පවත්වා තිළිණ ප්‍රදානයක්ද කළ බවත්ය. එසේම සමාගමේ කිසිදු ආර්ථික අපහසුතාවයක් නොතිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

ඉන්පසු මා විසින්ද මෙම සාක්ෂිකරුගෙන් පැහැදිලි කර ගැනීම සඳහා කරුණු විමසීමේදී පාරිතෝෂිකයෙන් කොටසක් ලැබුන බවත්, ඉතිරි මුදල එවන බවටත් කියා ඉංග්‍රීසියෙන් ලද ලිපියකට ආයතනය විශ්වාස කර අත්සන් තැබූ බවත් තවමත් ඒ විශ්වාසය පවතින බවත් ඔහු විසින් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී විමසීම ආරම්භ කිරීමට ප්‍රථම දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද විරෝධතාවය සලකා බලන ලදී. ඒ අනුව ප්‍රශ්නගත ලිපිය ඉතිරි මුදල ලැබෙනැයි අපේක්ෂා සහගතව අත්සන් කර ඇති බව සාක්ෂි මත හෙළිදරව් වන බැවින් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කල විරෝධතාවය ප්‍රතික්ෂේප කරමි.

ඉන්පසු පළමු පාර්ශ්වය විසින් ඔවුන්ගේ ඉල්ලුම්කරුවන් ඊ.ආර්.එල්. ගුණසේකර නැමැති සේවක මහතා කැඳවන ලදී. ඔහු 2019 වර්ෂයේ විශ්‍රාම ගිය බවට සාක්ෂි දෙන ලදී. එහිදී ඔහු ප්‍රකාශ කර සිටියේ සම්පූර්ණ පාරිතෝෂිකයෙන් භාගයක් ගෙවා පසුව ඉතිරි භාගය පසුව දෙන බවට දෙවන පාර්ශ්වය විසින් සඳහන් කළ බවය. ඒ අනුව ඔහුගේ සම්පූර්ණ පාරිතෝෂිකයේ අවුරුද්දකට මාසය බැගින් සේවය කළ කාල සීමාව වන අවුරුදු 30 ට ගණන් බලා ඉන් භාගයක් ගෙවා ඇති බවත්, එසේම ඔහු පළමුව උපාලි නිවුස් පේපර්ස් ආයතනයේත් දෙවනුව කැන්ඩොස් ආයතනයේත් සේවය කර ඇති බැවින් ආයතන දෙකම උපාලි ගෲප් එකට අයත් බවත් ප්‍රකාශ කර ඇත.

ඒ අනුව එම ආයතන දෙකේම සේවය කරපු අවුරුදු ගණන බලා ගෙවූ බව සඳහන් කරන ලදී. පළමු පාර්ශ්වයෙන් කැඳවනු ලැබූ කේ.ජී.කරුණාරත්න යන සාක්ෂිකරුද ප්‍රකාශ කරනු ලැබුවේ ඔහු කැන්ඩොස් ආයතනයේ සේවය කොට 2017 වර්ෂයේ විශ්‍රාම ගිය බවත් ඔහුගේ භාර්යාවද කැන්ඩොස් ආයතනයේ සේවය කළ බවත් ඇය 2019 දී විශ්‍රාම ගිය බවත්, ප්‍රකාශ කරන ලදී.

එසේම මෙම සාක්ෂිකරු අවුරුදු 32 ක් සේවය කළ බවත්, විශ්‍රාම යාමේදී අවුරුදු 32 ක් සේවය කර ඇති බවත් ඔහුට නියමිත සම්පූර්ණ පාරිතෝෂිකය (එනම් අවුරුද්දට මාසය බැගින්) කොටස් දෙකකින් ගෙවූ බවට සාක්ෂි ලබා දී ඇත. ඉන්පසු හරස් ප්‍රශ්න වලදී ලැබූ සම්පූර්ණ මුදලින් 1/2 ක් පාරිතෝෂිකය ලෙසද ඉතිරි භාගය හිතෛෂිභාවය (Ex-gracia) ලෙසට ලබාදුන් බවට දෙවන පාර්ශ්වය කරන ලද යෝජනාව ඔහු විසින් ප්‍රතික්ෂේප කර ඇත.

ඉහත කී සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙහෙයවීමෙන් අනතුරුව පළමු පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂිකරුවන් කැඳවීම අවසන් කරන ලද අතර, දෙවන පාර්ශ්වය වෙනුවෙන් කර්මාන්ත ශාලා ගණකාධිකාරි දර්ශනී ඒකනායක මහත්මිය කැඳවන ලදී.

එකී සාක්ෂිකාරිය අවුරුදු 23 ක් සේවය කරන ලද බවත් මෙහි ඉල්ලුම්කරුවන් සියලු දෙනාම හඳුනන බවටත් සාක්ෂි දී ඇත. මෙම ඉල්ලුම්කරුවන් සමහරකට මාස ගණනක පාරිතෝෂිකයට අමතරව තව වැඩිපුර මුදල් ප්‍රමාණයක් ලබාදුන් බවත් ප්‍රධාන කාර්යාලයෙන් එවූ පසු ඇය විසින් ලබාදුන් බවත් ප්‍රකාශ කරන ලදී. එසේම එම සේවකයින්ට මාස 1/2 ක පාරිතෝෂිකය ලබාදෙන අවස්ථාවේ ඉංග්‍රීසි භාෂාවෙන් ලියන ලද ලිපියකට අත්සන් ගත් බව ප්‍රකාශ කර සිටින ලද අතර සමහරුන් අත්සන් කලත් තවත් කොටසක් එය අත්සන් කිරීම ප්‍රතික්ෂේප කල බවටත් සාක්ෂි දෙන ලදී.

සාක්ෂිකාරිය හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් කියා සිටියේ පාරිතෝෂික ගෙවීම ආයතනය විසින් සේවා වර්ෂයකට මාසය බැගින් ගෙවූ බවත් එය 2017 ජූලි මාසයේ නැවැත්වූ බවත්ය. ඉන්පසු සමූහ මානව සම්පත් කළමනාකරු නෙරන්ජන් ෆොන්සේකා යන අය විසින් සාක්ෂි දෙමින් කියා සිටියේ 2005.12.31ට කලින් සියලුම සේවකයන්ට මුළු මාසයේ සැලරි එක ගෙවූ බවත්, එය දීර්ඝ කාලයක් තිස්සේ ගෙවූ බවත් වාර්ෂික වාර්තාවේද සඳහන් වී ඇති බවත් පිළි ගන්නා ලදී. එසේම පළමු පාර්ශ්වය විසින් 2017, 2018 වර්ෂ වලදී ද, සම්පූර්ණ පාරිතෝෂිකය ලැබූ සේවකයන්ගේ නම් සඳහන් කරමින් විමසුවිට සාක්ෂිකරු ඒ බැව් මතක නැති බව ප්‍රකාශ කරමින් ප්‍රශ්න මඟහරිමින් ක්‍රියා කල බව පෙනේ. 2006 ට පසු බැඳුන සේවකයන්ට සැලරි එකෙන් භාගයක්ද ඊට පසුව 2016.06.01 සියලුම සේවකයන්ට මාස භාගයක වැටුප් ගෙවීමටත් තීරණය කල බව ප්‍රකාශ කර ඔහු හිතන විදිහට 2017.07.01 පසු 100%ක් පාරිතෝෂිකය කිසිවෙකුට ගෙවා නොමැති බව ප්‍රකාශ කර ඇත. නමුත් 2017.07.02 දිනට පසු සේවයෙන් ඉවත් වූ සේවකයින්ගෙන් ඇතැම් සේවකයන්ට වර්ෂයකට මාසය බැගින් ගණන් බලා පාරිතෝෂිකය වාරික 3 කින් ගෙවූ බව හරස් ප්‍රශ්න වලදී පිළිගන්නා ලදී. ඉන්පසු ලකුණු කරන ලද ලේඛන සමඟ ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත.

මෙහිදී නිරාකරණය කිරීමට මා වෙත යොමු වී ඇත්තේ මෙම බේරුම්කරණ ක්‍රියාවලියට යොමු වී ඇති සේවකයන් විශ්‍රාම යාමේදී ඔවුන්ට වර්ෂයකට මාසයක වැටුප පදනම් කරගෙන පාරිතෝෂිකයේ ගෙවීම අහිමි කරමින් වර්ෂයකට මාස 1/2ක භාගයක වැටුප පදනම් කර ගෙවීම හේතු කොටගෙන ඔවුන්ට අසාධාරණයන් සිදු වී තිබේද යන්නයි.

මෙහිදී දෙපාර්ශ්වයෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි සුපරික්ෂාකාරීව බැලීමේදී පෙනීයන කරුණ වන්නේ,

දෙවන පාර්ශ්වය වන සිලෝන් ටොක්ලට් ලිමිටඩ් ආයතනය වඩා වැඩි වාසිදායක පාරිතෝෂිතයක් දීර්ඝ කාලයක් තිස්සේ, එනම් සේවකයින් විශ්‍රාම යන අවස්ථාවේ ලබාගත් අවසාන මාසික වැටුප සේවය කල වසර ගණනින් වැඩිකර පාරිතෝෂිකයක් ගෙවීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. එම ක්‍රියාවලිය දීර්ඝ කාලයක් තිස්සේ දෙවන පාර්ශ්වය පවත්වා ගෙන ගොස් තිබූ හෙයින්

සේවකයින් හා සමාගම අතර ලිඛිත නොවන ව්‍යංග ගිවිසුමක් ක්‍රියාත්මක වී ඇත. එසේම සමාගමේ මූල්‍ය වාර්ථාවල ද මෙම ගෙවීම් සඳහන්ව ඇති බව සාක්ෂි මඟින් හෙළිදරව් වී ඇත.

නමුත් දෙවන පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න වලදී මෙන්ම දෙවන පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි වලින්ද තහවුරු කිරීමට උත්සාහ දරා ඇත්තේ දෙවන පාර්ශ්වය විසින් ඔවුන්ගේ සේවකයන් විශ්‍රාම යන අවස්ථාවේ පළමු පාර්ශ්වය ප්‍රකාශ කරන පරිදි අවසාන ලබාගත් වැටුප වැඩ කරන ලද අවුරුදු ගණනින් වැඩිකර ලැබෙන මුදල සේවකයින් හට ගෙවූ අතර, සමාගමේ මූල්‍ය අපහසුතාවයන් මත 2016.09.06 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් වී 3 ලෙස ඉදිරිපත් කරන ලදී.

එහි වී. 13 ලෙස ඉදිරිපත් කර ඇති පාරිතෝෂිත ගෙවීම් වෙනස් කිරීම තේමාව යටතේ 2016.09.06 දින අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනා සම්මතයක් ඉදිරිපත් කර ඇත.

එම යෝජනා සම්මතයේ මෙතෙක් සමාගමේ පාන්තෝෂික ගෙවීම් සම්බන්ධව ඔවුන් විසින් පවත්වාගෙන ආ පහත සඳහන් ප්‍රතිපත්ති එනම්,

a. 2005.12.31 දිනට හෝ ඊට ප්‍රථම සමාගමට බැඳී සේවකයින් හට සම්පූර්ණ මසක මූලික වැටුප X වැඩකල අවුරුදු ගණන

b. 2006.01.01 දිනට හෝ ඊට පසු සමාගමට බැඳුණු සේවකයන් හට මසක මූලික වැටුපෙන් භාගයක් x වැඩකල අවුරුදු ගණන

ලෙස දක්වා ඇති අතර ඉහත විස්තර කර ඇති පරිදි ඔවුන් විසින් පවත්වාගෙන ආ ප්‍රතිපත්තිය ආයතනයේ යහ පැවැත්මට පහත පරිදි සංශෝධනය කර ඇත.

එනම් සියළුම සේවකයින් හට මීසක මූලික වැටුපෙන් භාගය x වැඩකල අවුරුදු ගණන ලෙස පාරිතෝෂිකය ගණනය කල යුතුය.

එකී සංශෝධන 2016.07.01 වන දින සිට ක්‍රියාත්මක වන බවත් එහි දක්වා ඇත.

2016.09.06 දින කරන ලද යෝජනා සම්මතයන්ට අනුව 2005.12.31 දිනට ප්‍රථම සේවයට බැඳුණු සේවකයන්හට ඒ අනුව සම්පූර්ණ මසක මූලික වැටුප X සේවය කළ අවුරුදු ගණනින් ගණනය කර පාරිතෝෂිකය ගෙවා ඇති බව දෙවන පාර්ශ්වය පිළිගත් කරුණකි.

මෙම බේරුම්කරණයට ඉදිරිපත් වී ඇති ඉල්ලුම්කරුවන් 16 දෙනාම එකී දිනයට පෙර එනම් 2005.12.31 දිනට ප්‍රථම සේවයට බැඳුණු සේවකයින් බව දෙපාර්ශ්වය විසින් පිළිගෙන ඇත.

එකී කරුණු මත මෙම සියලුම ඉල්ලුම්කරුවන් V 13 දරන යෝජනා සම්මතයේ සඳහන් කර ඇති ඡේදයට වැටෙන බව සැහැදිලි වන කරුණයි.

දෙවන පාර්ශ්වය වශ සමාගම විසින් V13 හිහහාර ලෙස දක්වා ඇති ක්‍රමවේදය යනුව පාරිතෝෂික ගෙවීම දීර්ඝ කාලයක් තිස්සේ අනුගමනය කර ඇති නිසා පළමුවන පාර්ශ්වයේ සේවකයින් විසින් දෙවන පාර්ශ්වය සමඟ ව්‍යංග ගිවිසුමකට බැඳී සිටිය බවට මෙහිදී ඉදිරිපත් වූ කරුණු ප්‍රතික්ෂේප වූයේ නැත.

එසේම මෙසේ කාලයක් පවත්වාගෙන ආ පාරිතෝෂික ගෙවීමේ ක්‍රමවේදය 2016.09.06 වන දිග ආයතනයේ යහ පැවැත්ම සඳහා යයි සඳහන් කරමින් කරන ලද සංශෝධනය දෙවන පාර්ශ්වය විසින් සාධාරණීය කිරීම සඳහා කරුණු ඉදිරිපත් කළේ නැත.
නමුත් ආයතනය පාඩු ලබන ආයතනයක් නොවන බව පෙන්වීමටත් ඒ අනුව පාර්තෝෂික ගෙවීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම අසාධාරණ බව පෙන්වීමටත් පළමුවන පාර්ශ්වය විසින් මෙහිදී කරුණු දක්වන ලද අතර එම කරුණු බිඳ හෙළීමක් සිදුවූයේද නැත.

මෙම කරුණු වලට අමතරව මෙම බේරුම්කරණයේදී බැලිය යුතු වැදගත්ම කරුණක් ලෙස මා සලකන්නේ එකම කාණ්ඩයකට අයත් සියළුම සේවකයන්ට සමානතාවයෙන් සැලකීම කර ඇත්ද යන්නයි එනම් යෝජනා සම්මතයේ සඳහන් දිනෙන් පසු සියළුම සේවකයින් හට පාරිතෝෂික ගෙවා ඇත්තේ එකී යෝජනා සම්මතයට අනුවද යන්නයි.

මෙහිදී පළමු පාර්ශ්වය විසින් සාක්ෂි මඟින් ඉදිරිපත් කරන ලද කරුණු වලට අනුව. පාරිතෝෂිතය ගෙවීමේ මාසික මූලික වැටුපෙන් භාගය X සේවය කල වසර ගණන ලෙස ගණනය කිරීමට දෙවන පාර්ශ්වය විසින් 2016.09.06 දින සංශෝධනයක් ඉදිරිපත් කරමින් තීරණය කර ඇතත්, එකී තීරණයට පටහැනිව කිහිප දෙනෙකුට මූලික වැටුප X සේවය කල වසර ගණන යන සමීකරණයට ගැලපෙන ලෙස සාරිතෝෂිකය ගෙවා ඇති බවයි. දෙවන පාර්ශ්වය ගෙනෙන ලැබූ තර්කය වූයේ එසේ මූලික වැටුපම සලතා පාරිතෝෂිතය ගණනය කලේ යයි පළමු පාර්ශ්වය ඉදිරිපත් කල අවස්ථාවන්හිදී එම අමතර දීමනාව හිතේෂිභාවය (Ex Gracia) සඳහා වන ප්‍රදානයක් බවයි. කෙසේ වුවද සමාගම විසින් එවැනි ක්‍රම වේදයක් අනුගමනය කරන බවට පිළිගත හැකි කිසිදු ලේඛණයක් නොරිපත් වූයේ හෝ සාක්ෂියක් ඉදිරිපත් කලේ නැත. ඒ අනුව දෙවන පාර්ශ්වය විසින් එකම බාණ්ඩයට අයත් සේවකයින් සිහිප දෙනෙකුට මූලික වැටුප X සේවා කාලය ලෙස පාරිතෝෂිකය ගෙවා ඇති බවට පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි සිඳ හෙළිමත් සිදු නොවූ බව මම තීරණය කරමි

ඉහත සියළු කරුණු සලකා ඉල්ලුම්කරුවන් 16 දෙනාට ඔවුන්ගේ මාසික වැටුප සේවය කළ වසර ගණනින් වැඩිකර ලැබෙන මුදල පාරිතෝෂිකය වශයෙන් ලැබිය යුතු බවට මම තීරණය කරමි.

ඉල්ලුම්කරුවන් 16 දෙනා P-1 ලෙසට ඔවුනට ලැබිය යුතු සහ දැනට ලැබී ඇති මුදල ද, ලැබිය යුතු මුදලද සඳහන් ඉදිරිපත් කර ඇති ලේඛනය අනුසාරයෙන් ඔවුන්ට ලැබිය යුතු හිඟ මුදව පහත දක්වා ඇති ආකාරයට ගෙවිය යුතු බවද තවද මෙකී පාරිතෝෂික මුදල ගෙවීම නියමිත දිනට මාස 12 ට වැඩි කාලයක් ප්‍රමාද වී ඇති බැවින් 1992 අංක 62 දරන පාරිතෝෂික ගෙවීම සංශෝධිත පනතේ සඳහන් පරිදි එම මුදලට 30% ක අධිභාරයක් ද හිමිවිය යුතු බවත් තීරණය කරමි.

ඒ අනුව ඉල්ලුම්කරුවන් 16 දෙනාට පහත සඳහන් පරිදි හිඟ පාතෝෂික මුදල සහ අධිභාරයද ප්‍රදානය කරමි.

තවද මෙම බේරුම් කරණ ක්‍රියාවලිය විමසීමට ගත් අතරවාරයේදී ඉල්ලුම්කාර පාර්ශ්වයේ එම්.ජී.පී.ඩී. කුමාරි යන අය මියගොස් ඇති බවට ඇයගේ මරණ සහතිකය බේරුම්කරණයට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව ඇයට හිමි සියළු දීමනා ඇයගේ උරුමකරුවන්ට නිසි පරිදි බෙදී යායුතු බවත්, තීරණය කරමි.

මෙම ප්‍රදානය ගැසට් ගත වූ පසු මාස දෙකක් ඇතුළත දිස්ත්‍රික් සම්පූර්ණ මුදල වන රුපියල් එකළොස් මිලියන හය ලක්ෂ අසූ දහස් අටසිය අනූ එකයි ශත තිහක් (11,680,891.30) මහනුවර උතුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට නියෝග කරමි.

අනු අංකය	සේවා අංකය	නම	ලැබිය යුතු ඉතිරි පාරිතොෂික මුදල	අධිකාරය 30%	මුළු මුදල
1	421	ආර්.විශාකා කාන්ති	844,255:00	253,276.50	1,097,531.50
2	430	ඩී.එම්.සී.පී දිසානායක	305,176.00	91,552.80	396,728.80
3	395	අයි.එම් විජිතා කුමාරි	625,597.00	187,679.10	813.276.10
4	1591	පී.එච්. උපාලි රණතුංග	380,624.00	114.187.20	494,811.20
5	473	එච්.එම්.ජේ. මැණිකේ	460,172.00	138,051.60	598,223,60
6	470	එම්.පි දයානි පෙරේරා	452,690.00	135,807.00	588,497.00
7	443	ඊ.සී.එස්. පෙරේරා	767,415.00	230,224.50	997.639.50
8	471	එච්.ජී.අමරසිලි	489,840.00	146,952.00	636,792.00
9	1589	ඊ.ආර්.එල් ගුණසේකර	513,870.00	154,161.00	668,031.00
10	483	කේ.එම්.ඩබ්. යටවර	820,335.00	246,100.50	1,066,435.50
11	450	කේ.ඒ සුනිල්	791,184.00	237,355.20	1,028,539.20

12	394	ජේ.එම්. පුෂ්පලතා	791,146.00	237,343.80	1,028,489.80
13	465	ඩබ්. එම්. බී. විජේතුංග	495,000.00	148,500.00	643,500.00
14	532	ඩී.එම් චන්ද්‍ර කුමාරි	445,077.00	133,523.10	578,600.10
15	602	ඩබ්.එම්.ඩබ්. රණතුංග	464,400.00	139,320.00	603,720.00
16	558	එම්.ජී.පී.ඩී. කුමාරි	338,520.00	101,556.00	440,076.00
			මුළු මුදල		11,680,891.30

මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත පුදානයක් බවද ප්‍රකාශ කරමි.

නීතිඥ ටී.සී. ජේ. පීරිස්,
බේරුම්කරු.

2024 ඔක්තෝබර් මස 01 වැනි දින.

EOG 11 – 0189

කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.03.18 දිනැති හා අංක 2376/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.03.13 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දෙහිවල, කරගම්පිටිය, ඇලන් මාවත, අංක 174 හි පදිංචි ආර්. යූ. එස්. ප්‍රනාන්දු මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, ජාවත්ත පාර, අංක 133 හි පිහිටි මර්කන්ටයිල් ප්‍රොඩියුස් බෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 10/2024 හා 2024.10.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 නොවැම්බර් මස 01 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ අංශයේදීය.

නඩු අංකය A/10/2024
IR/COM/01/2022/157

ආර්. යූ. එස්. ප්‍රනාන්දු මයා
අංක 174,
ඇලන් මාවත,
කරගම්පිටිය,
දෙහිවල. (පළමු පාර්ශ්වය)

එදිරිව

මර්කන්ටයිල් ප්‍රොඩියුස් බෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 133,
ජාවත්ත පාර,
කොළඹ 05. (දෙවන පාර්ශ්වය)

අතර පවතින කාර්මික ආරවුල.
බේරුම්කරණ තීන්දු ප්‍රකාශය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක14 හා 1957 අංක 62 හා1962 අංක 04 හා1968 අංක 39(1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

"මර්කන්ටයිල් ප්‍රොඩියුස් බෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සේවය කළ ආර්. යූ. එස්. ප්‍රනාන්දු මහතාගේ සේවය විනය හේතුන් මත 2014.07.24 වෙනි දිනැති ලිපිය මගින් 2014 06.26 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීම හා ඔහුට විරුද්ධව කිසිදු විනය පරීක්ෂණයක් සිදු නොකර පත්වීම් ලිපිය ප්‍රකාරව ඔහුගේ වයස අවුරුදු 55 වන තෙක් එනම් 2017.03.14 වෙනි දින දක්වා වැටුප් නොගෙවීම මගින් ආර්. යූ. එස් ප්‍රනාන්දු මහතාට අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ. මෙම නඩුකරයට අදාළ පරීක්ෂණ කටයුතු සහ සාක්ෂි මෙහෙයවීම 2024.04.24, 2024.05.16, 2024.06.11, 2024.07.04. හා 2024.07.10 යන දිනයන්හි සිදුකොට අවසන් කරන ලදී.
පළමු පාර්ශ්වය හෙවත් පැමිණිලිකරු තම පළමු හා දෙවන විස්තර ප්‍රකාශන තුළින් ගරු බේරුම්කරණ අධිකරණය වෙත පහත සඳහන් කරුණු ඉදිරිපත් කෙරේ.

1. දෙවන පාර්ශ්වය හෙවත් වග උත්තරකාර පාර්ශ්වය විසින් පැමිණිලිකරුට 1998.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක ශ්‍රේණියේ Mills Manager ලෙස පත්වීමක් ලබා දී ඇත එම පත්වීම ලිපියට අනුව පැමිණිලිකරුට වයස අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් සේවය කළ හැකිවේ.

2. විනය හේතු මත දෙවන පාර්ශ්වය විසින් පැමිණිලිකරුගේ සේවය 2014.06.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවා ඇත. තේ බෑග්43ක් අසුරා අවිධිමත් සහ නීති විරෝධී ලෙස අංක 47-7409 දරන ලොරි රථයේ රියදුරු මොහොමඩ් යන අයට ලබාදී, එම තේ තොගය ප්‍රවාහනය කිරීමට අදාළව රියදුරු සමඟ ලොරි රථය අත්අඩංගුවට ගෙන පළමු පක්ෂයද, ගබඩාවට අනුයුක්ත ගබඩාකරුවන් දෙදෙනෙකුද ඉන්පසු අත්අඩංගුවට ගෙන නඩු අංක B/2908/14 යටතේ මහර ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කළ බව දන්වා ඒ සම්බන්ධයෙන් මහර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 70485/14 දරන නඩුව පළමු පක්ෂය ඇතුළු තවත් තිදෙනෙකුට ගොනුකොට තිබූ අතර එකී නඩුවේ මහර ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ 2020.02.25 දිනැති කාර්ය සටහනට අනුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 188 (11) වගන්තිය ප්‍රකාරව පළමු පක්ෂය නිදහස් කර ඇත. එකී නිදහස් කිරීම දැනට වසරක කාලය ඉක්මවා ඇති බැවින් එම නිදහස් කිරීම නිදොස් කොට නිදහස් කිරීමක් ලෙස දක්වා ඇත.

3. දෙවන පක්ෂය විසින් පළමු පක්ෂයේ සේවය අත්හිටුවීමෙන් පසු පළමු පක්ෂයට විරුද්ධව කිසිදු චෝදනා පත්‍රයක් නිදහසට කරුණු විමසීමක් ඉදිරිපත් කොට විනය ක්‍රියාමාර්ග කිසිවක් රැගෙන නොමැති වේ. එමෙන්ම පත්වීම් ලිපිය ප්‍රකාරව 2017.03.14 දින දක්වා පළමු පක්ෂයට සේවය කිරීමට තිබූ අවස්ථාව අහිමි කර ඇත.

පළමු පක්ෂය විසින් දෙවන පක්ෂය අමතා ස්වකීය නීතිඥවරුන් මගින්2021.06.21 දිනැතිව යවන ලද ලිපියට අනුව වර්ෂ 2021 07. 05 වෙනි දින හෝ එදිනට පෙර පළමු පාර්ශ්වය හිඟ වැටුප් සහිතව සේවයේ පිහිටුවීමට කටයුතු කරන ලෙසත්, එසේ නොකළහොත් දෙවන පාර්ශවයට විරුද්ධව සුදුසු නෛතික ක්‍රියාමාර්ග ගෙන 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනතේ සහ සංශෝධනයන්හි විධිවිධාන ප්‍රකාරව සහන ලබා ගැනීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගන්නා බව දක්වා ඇත. නමුත් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් දෙවන පාර්ශ්වය ගෙන නැත.

4 දෙවන පාර්ශ්වය විසින් පළමු පක්ෂයේ සේවය 2014.07.24 දින වැටුප් රහිතව අත්හිටවා කිසිදු විනය පරීක්ෂණයක් නොපවත්වා කටයුතු කිරීම අසාධාරණ හා අයුක්ති සහගත බවත් පළමු පක්ෂයේ පත්වීම් ලිපිය ප්‍රකාරව වයස අවුරුදු 55 සම්පූර්ණ වන 2017 03.14 දින දක්වා වැටුප් ලබා ගැනීමට හිමිකමක් ඇති බවත් ඒ අනුව2017.03.14 වෙනි දින දක්වා නොගෙවූ වැටුප් ගෙවන ලෙසට තීන්දු ප්‍රදානයක් පළමු පක්ෂයේ වාසියට ඉල්ලා ඇත.

5. මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩු විභාගයේදී අගතියට පත් දෙවන පාර්ශ්වය චෝදනා ඔප්පු කිරීමට උනන්දුව ක්‍රියා කළ යුතුව තිබුණි. ප්‍රශ්නගත තේ බෑග් ගේට්ටු අවසර පත්‍ර පිට ලබාගෙන තිබූ බවත් ඒ බව නඩු ගොනුවේ අංක 29572 හා 29573 දරන අංකයන්ට අදාල ගේට්ටු අවසර පත්‍ර මගින් තහවුරු කර ඇත.

තවද දෙවන පක්ෂයේ කළමනාකරණ අධ්‍යක්ෂ ජයම්පති නරේන්ද්‍ර දඩවින්න සහ මූල්‍ය අධ්‍යක්ෂ අනුර ගාමිණී විතානගේ යන දෙදෙනාට අධිකරණය මගින් සිතාසි නිකුත් කොට ඇතත් ඔවුන් ද මහර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් වී නොමැති බව නඩුවෙහි කාර්ය සටහන අනුව තහවුරු වී ඇත.

6. සේවය අත්හිටුවීමෙන් පසු පළමු පාර්ශ්වය සම්බන්ධයෙන් විධිමත් විනය ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම දෙවන පාර්ශ්වය පැහැර හැර ඇත.

7 පළමු පක්ෂය විසින් කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත ඉදිරිපත් කළ CLE/COM/D9/324/2021/08 දරන

පැමිණිල්ලට අදාලව පැමිණිලි විභාගයේදී ඉදිරිපත් වූ කරුණු මත එතෙක් නොගෙවා තිබූ පාරිතෝෂික මුදල සහ අධිභාර මුදල ගණනය කොට දෙවන පාර්ශ්වයට දැනුම්දීමෙන් පසු එකී අනිවාර්යෙන්ම ගෙවිය යුතු ව්‍යවස්ථාපිත දීමනාවක් වන පාරිතෝෂික මුදල දෙවන පාර්ශ්වය විසින් ගෙවීමට කටයුතු කොට ඇත.

8 පළමු පක්ෂයට වසර 55 ක් සම්පූර්ණ වන තෙක් එනම් 2014.06.28 දින සිට 2017.03.14 වන දින දක්වා නොගෙවූ වැටුප ලබා ගැනීමේ නෛතික හිමිකම් ඇති බව අවධාරණය කෙරේ.

දෙවන පාර්ශ්වය හෙවත් වග උත්තරකාර පාර්ශ්වය ද තම පළමු හා දෙවන විස්තර ප්‍රකාශන තුළින් පහත සඳහන් කරුණු ලිඛිතව පැහැදිලි කොට ඇත.

1. මෙම කාර්මික ආරාවුලේ ඉල්ලුම්කරු 1998 ජුලි මස 01 වන දින සිට වගඋත්තරකාර සමාගමේ Mill Manager වශයෙන් සේවය කර ඇත.
2. ඉහත ඉල්ලුම්කරු 2014 ජුලි මස 24 දින විනය හේතුන් මත සේවය අත්හිටුවා ඇත.ඔහුගේ පත්වීමේ ලිපියේ 15 වන වගන්තිය අනුව සේවා යෝජකට විනය කරුණු මත සේවය අත්හිටුවීමට අයිතිය ඇත.
3. ඉල්ලුම්කරු 2014 ජුනි මස 24 දින සමාගමට අයත් තේ කිලෝ 1902.50 Bin Tea වශයෙන් ලකුණු කොට බෑග් 43 අසුරා සමාගමට අයත් අංක 47-7409 දරන ලොරි රථයෙන් ප්‍රවාහනය කර සොරකම් කිරීමට උත්සාහ කර ඇත
4. ඉහත සිද්ධිය සම්බන්ධයෙන් පැලියගොඩ පොලිසියේ කොට්ඨාස අපරාධ විමර්ෂණ අංශය මඟින් පරීක්ෂණයක් පවත්වා ඉහත ඉල්ලුම්කරු ඇතුලු ගබඩාවට අනුයුක්ත තවත් සේවකයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් භාරයේ තබා ඇපමත නිදහස් කොට ඇති අතර ඔවුන්ට එරෙහිව මහර ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ D/2908/L4 යටතේ නඩු පවරා තිබුණි.
5. ඉහත නඩුවේදී ඉල්ලුම්කරුට සහ අනෙකුත් සේවකයන් දෙදෙනාට පහත සඳහන් චෝදනා ඉදිරිපත් කර ඇත.

1. ඉල්ලුම්කරු තවත් අනිත් වූදිතයින් 2014.06.20 හෝ ඊට ආසන්න දිනකදී සමාගමට අයත් අංක 220 පැලියාතුඩුව ගබඩා සංකීරණයේ රුපියල් ලක්ෂ පහක් (500,000/-) පමණ වටිනා තේ කොළ කිලෝග්‍රෑම් 1902.50 අපගේ බෑග් 43 ක් සොරකම් කිරීම.
11. එම සොරකම කිරීමෙන් වංක ලෙස සහ සාපරාධී ලෙස විශ්වාසය කඩකිරීම.
III. එම සොරබඩු අංක 47-7409 දරන ලොරි රථයේ ගබඩා කර සන්තකයේ තබා ගැනීම

6. ඉහත නඩුව මහර ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ 2015.06.21 දින සිට 2020.02.23 දක්වා පවත්වා ගෙන ගොස් ඇත.
7. එම නඩු වාර්තා පරීක්ෂා කිරීමේදී එහි 25 වන පිටුවේ ඉල්ලුම්කරු මාස 03 ක වැටුප් ලබාගෙන මෙම නඩුව සමථයකට පත්වීමට කැමැත්ත දක්වා ඇත.
8. ඉන්පසු 2020.02.25 දින ඉල්ලුම්කරු ඇතුලු වූදිතයින් මෙම නඩුවෙන් නිදහස් කොට ඇත. එම තීන්දුවේ පැහැදිලිව දක්වා ඇත්තේ පැමිණිල්ල (පැලියගොඩ විශේෂ විමර්ෂන අංශය) සම්බන්ධව උනන්දුවක් නැති බවයි. විශේෂයෙන්ම පැමිණිල්ලේ පළමු වන පැමිණිලිකරු පොලිස් සැරයන් ධරමසිරි බණ්ඩාර (33507) යන අය වරෙන්තුවක් නිකුත්කොට පවා තිබිය දී නඩුවේ සාක්ෂි දීමට අධිකරණයට පැමිණ නොමැති බවයි.
9. මේ අනුව පැහැදිලිව පෙනී යන්නේ ඉහත ඉල්ලුම්කරු නඩුවේ තිබූ තාක්ෂණික දෝෂයක් (Technical Defect) හේතුවෙන් නිදහස් වී ඇති අතර සාක්ෂි විභාගයක් පවත්වා නඩුවේ චෝදනා වලින් නිදහස් සහ නිදොස් කොට නොමැති බවයි.
10. ඉල්ලුම්කරු 2014 ජුලි 24 දින සිට සේවයෙන් අත්හිටුවා ඇත.එසේම 2020.02.25 දින අදාල නඩුවෙන් නිදහස් කොට ඇත. 2014 වසර සිට 2020 වසර දක්වා වසර 06ක කාලයක් ඉහත ඉල්ලුම්කරු ඔහුගේ රැකියාව නැවත ලබා ගැනීමටත් වැටුප් ඉල්ලීමක්වත් අවම වශයෙන් ලිපියක් මගින්වත් සමාගම දැනුවත් කර නොමැත. එසේම එම කාලසීමාව තුල ඔහුට කම්කරු විනිශ්වය සභාව වෙත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබුණි.
11. ඉල්ලුම්කරු 2022.02.11 දින වගඋත්තරකාර සමාගමට ලිපියක් එවමින් ඔහුගේ රැකියාව හිඟ වැටුප් ඉල්ලා ඇත.මෙය ඔහුගේ සේවය අත්හිටුවීමෙන් වසර 07කට පසුව වන අතර නඩුවෙන් නිදහස් වී වසරකට පසුවය.
12. 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ වගන්ති අනුව එසේ යම් සේවකයෙකු සේවය අත්හිටුවීමෙන් පසු අදාල නිශ්චිත කාල සීමාවක් තුල සහන ලබා ගැනීමට අදාල ප්‍රතිපාදන සලසා ඇත.
13. මේ අනුව ඉල්ලුම්කරුගේ සේවය අත්හිටුවා වසර 07ක් ගතවන තුරු ඔහුගේ රැකියාව වැටුප සම්බන්ධව උනන්දුවක් හෝ වුවමනාවක් දක්වා නොමැත.
14. තවද 2017.03.14 දින වන විට ඉල්ලුම්කරු 55 විය ඉක්මවා ඇත. ඔහු විශ්‍රාම ගොස් වසර 05කින් පසු ඔහුගේ නැවත සේවය හා හිඟ වැටුප් ඉල්ලා ඇත.තවද ඔහු විශ්‍රාම යාමෙන් පසු ඔහුට අදාල ව්‍යවස්ථාපිත දීමනා(EPF/ETF) ලබාගෙන ඇත.
15. එසේම ඔහු විසින් 2014.06.26 වන දිනෙන් අවසන් වන අවුරුදු 15 ක සේවා කාලයට අදාලව හිමිවිය යුතු පාරිතෝෂිත දීමනා අධිභාරය ද ඇතුලුව රු 702,000/- කට හිමිකම් පා ගෙවා නිමාකොට ඇත.
16. ඉහත දැක් වූ කරුණු මත ඉල්ලුම්කරු මෙම හිඟ වැටුප්වලට හිමිකම් නොමැති බව සේවායෝජකගේ තීරණයයි.

තවදුරටත් දෙවන පාර්ශ්වයෙහි දෙවන විස්තර ප්‍රකාශනය තුලින් ලිඛිතව කරුණු දක්වමින් පෙන්වා දී ඇත්තේ ඉල්ලුම්කරුගේ ප්‍රකාශනයේ අංක 01 අංක 02 අංක 07 අංක 08 සහ අංක 10 යටතේ දක්වා ඇති කරුණු පිළිගන්නා බවත් 1998 ජූලි 01 සිට දෙවන පක්ෂය සේවය අත්හිටු වූ දවස දක්වා සේවය කර ඇති බව පිළිගන්නා බවත්ය. තවදුරටත් ඉල්ලුම්කරුගේ ප්‍රකාශනයේ අංක 05 අංක 11 පිළි නොගන්නා බවත්ය.

මෙම නඩුකරයේදී 2024.07.04 දින හා 2024.07.10 දින සාක්ෂි විමසා සිටින ලද අතර එම සාක්ෂි විමසීමේදී ගරු බේරුම්කරණ අධිකරණය විසින් පළමු හා දෙවන පාර්ශ්වය විසින් පහත සඳහන් සාක්ෂි විමසා සිටින ලදී.
බේරුම්කරණය පළමු පාර්ශ්වයෙන් මෙසේ විමසා සිටි:

ප්‍ර : තමන් මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස් ආයතනයේ සේවය කලා?
පි : ඔව්.
ප්‍ර : අවුරුදු කීයක් සේවය කලාද ?
පි : අවුරුදු 17ක්.
ප්‍ර : මේ ප්‍රශ්ණය වෙලා වැඩ තහනම් කරන කාලය තෙක් කලින් සේවය කරපු අවුරුදු 17ක පමණ කාලය ඇතුලත මොනාහරි විනය චෝදනාවක් හෝ වැඩ තහනම් කිරිමක් කර තිබෙනවාද ?
පි : කිසිම දවසක නැහැ.
ප්‍ර : තේ වගයක් අස්ථානගත වීම යටතේ තමන්ව පොලිස් අත්අඩංගුවට පත්වුණා ?
පි : ඔව්.
ප්‍ර : පොලිස් අත්අඩංගුවට ගත්ත නිසා තමන්ගේ රාජකාරි අත්හිටු වූවා ?
පි : ඔව්.
ප්‍ර : මේ නඩුකරය මහර අධිකරණයේ විභාගයට ලක්වුණා?
පි : ඔව්.
ප්‍ර : නඩුකරය අවසානයේදී තමන් ඒ නඩුවෙන් නිදහස් කලා?
පි : ඔව්.
ප්‍ර : තමන් අවුරුද්දක කාලයක් බලාගෙන හිටියා ඒ නඩු තීන්දුව නිදොස් කොට නිදහස් කර ගන්න ?
පි : ඔව්.
ප්‍ර : ඒ සිද්ධියෙන් පස්සේ නැවත තමාට වෙච්ච අසාධාරණයට හිඟ වැටුප් ඉල්ලලා මර්කන්ටයිල් ප්‍රෝඩියුස් බ්‍රෝකර්ස් ආයතනයට ඉල්ලීමක් කලා ?
පි : ඔව්.
ප්‍ර : තමන් මේ නඩුකරය ආරම්භ වුණාට පස්සේ තමන්ට ලැබෙන්න තිබෙන මුදල කොපමණද කියලා ගණන් බලලා මේ බේරුම්කරණ අධිකරණයට ඉදිරිපත් කලා ?
පි : ඔව්.
ප්‍ර : තමන්ගේ අපේක්ෂාව තිබෙන්නේ මේ බේරුම්කරණ අධිකරණයෙන් තමන්ට වෙච්ච අසාධාරණයට සිදුවුණ මූල්‍යමය අලාභය අයකර ගැනීමට?
පි : ඔව්.

බේරුම්කරණය දෙවන පාර්ශ්වයන් මෙසේ විමසා සිටි

ප්‍ර : මේ පළමු පාර්ශ්වය ආයතනයේ කිසියම් හොරකමකට ලක්වුණා කියන කාරණය මත තමයි ඔහුගේ සේවය අත්හිටු වූයේ ?
පි : ඔව්.
ප්‍ර : ඊළඟට අධිකරණ ක්‍රියා මාර්ගයකට ගියා ?
පි : එසේය. අප සමාගම විසින් නෙමෙයි පොලිසිය විසින්.
ප්‍ර : එසේ අධිකරණ ක්‍රියා මාර්ගයකට ගියාම පොලිසිය විසින් අධිකරණ ක්‍රියා මාර්ගයට අවතීරණය වුණා ?
පි : එසේය.
ප්‍ර : ඒ අධිකරණ තීරණය අවසානයේදී මේ නඩුවෙන් මේ විත්තිකරු නිදහස් වුණාද නැද්ද?
පි : ස්වාමිනී, අධිකරණ වාර්තාවට අනුව සාක්ෂිකරුවන් මෙම නඩුවට සාක්ෂි දෙන්න නොපැමිණීම හේතුව මත නිදහස් කරලා.

ප්‍ර: මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්තුමාගේ තීන්දුවට එරෙහිව ඉහල අධිකරණයට කම්පැණිය පැත්තෙන් අභියාචනයක් කලාද නැද්ද?
පි: ස්වාමිනි. එම අභියාචනය කල යුත්තේ අප නෙමෙයි. පැමිණිල්ල යොමු කරලා තිබුණේ පොලිසියෙන්නේ. පොලිසිය මගින් ඒ පිළිබඳ අභියාචනයක් අවශ්‍ය නම් කරන්න තිබුණා නමුත් එහෙම කරලා නහැ.
ප්‍ර: මේ පැමිණිලිකරුගේ සේවය 2014.06.26 දින තහනම් කලා ඒ අනුව ඔහුගේ වැඩ තහනම් නොකලේ නම් ඔහු විශ්‍රාම යාමට තිබුණේ 2017.03.17ද?
පි: පිළිගන්නවා.
ප්‍ර: එදින වයස අවුරුදු 55 සම්පූර්ණ වෙන නිසා?
පි: ඔව්.
ප්‍ර: මේ පැමිණිලිකරුගේ සේවය අවසන් කලාට පස්සේ ඔහු විශ්‍රාම වයස ඉක්මවන තෙක් කිසිදු අභියාචනයක් හෝ රැකියාව ඉල්ලීමක් මේ සමාගමට ඉල්ලීමක් කලේ නැහැ?
පි: නැහැ.

ප්‍ර: ඔහු අධිකරණයෙන් නිදොස් කොට නිදහස් කලාට පස්සේ ඉල්ලීමක් ඉදිරිපත් කලාද නැද්ද?
පි: මම කියා සිටින්න ඕනේ ඒ නිදොස්කොට නිදහස් කිරීම සම්බන්ධව සමාගම දැනගෙන හිටියේ නැහැ අවුරුද්දක් යනකල්. එහෙම ඉල්ලීමක් කලෙත් නැහැ.
ප්‍ර: පළමු පාර්ශ්වය කියා සිටියා නිදොස් කොට නිදහස් කලහම ඉල්ලීමක් කලා කියලා ?
පි: නිදහස් කොට වසරකින් පස්සේ ඉල්ලීමක් කලා.
ප්‍ර: X5 සම්බන්ධයෙන් ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද?
පි: ඒ සම්බන්ධයෙන් කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. විශාල හිඟ වැටුප් ප්‍රමාණයක් ඉල්ලා සිටියා එමනිසා පාලන අධිකාරියෙන් කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ.
ප්‍ර: මොහුට හිමි පාරිතෝෂිත මුදල ගෙවා අවසන්ද ?
පි: එසේය
ප්‍ර: පාරිතෝෂිත මුදල ගෙව්වේ 2014 වැඩ තහනම් කල දිනය දක්වාද ?
පි: 2017 ඔහු විශ්‍රාම යන දිනය දක්වා පාරිතෝෂිතය ගෙව්වා.
ප්‍ර: මොහුගේ සේවය අවසන් කලේ 2014 නම් 2017.06.14 විශ්‍රාම යන දිනයේ වැටුප ගණන් බැලුවේ?
පි: ඉල්ලුම්කරු කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කරලා තිබුණා පාරිතෝෂිතය නොගෙවීම සම්බන්ධයෙන්. එතකොට කම්කරු දෙපාර්තමේන්තුවෙන් අපිට නියෝගයක් දුන්නා මොහුගේ විශ්‍රාම වැටුප ගෙවන්න කියලා. එම ඉල්ලීම අනුව අපි ගෙව්වා.
ප්‍ර: ඒ පාරිතෝෂිතය ගෙවන්න උපයෝගි කරගත්ත වැටුප මොකක්ද?
පි: 2014 වැටුප ලබපු අන්තිම වැටුප.
පි: 2014 ලබපු අවසාන වැටුප මත සේවා කාලය ගණන් ගන්න කොට 2017 දක්වා ගණන් ගත්තා?
ප්‍ර: ඔව්. ගණන් ගන්න කියලා අපිට නියෝග කලා අපි ඒක කලා.
ප්‍ර: වැඩ තහනමක් කියන්නේ දඩුවමක් නෙමෙයිනේ. ඒක නිකන් තාවකාලික වාරණයක් විතරයි ?
පි: ඔව්.
පි: ඒකේ කොන්දේසි තිබෙනවා වැටුප් ගෙවන්නේ නැහැ කියලා ?
පි: ඔව්.
ප්‍ර: වැඩ තහනම් කලාට පස්සේ ඕනෑම ආයතනයක අනුගමනය කරන පොදු ක්‍රියාමාර්ග කිහිපයක් තිබෙනවා ඒවා මොනවාද?

පි: ස්වාමීනි, අපි සාමාන්‍යයෙන් හේතු දැක්වීමේ ලිපියක් ඉස්සෙල්ලාම නිකුත් කරනවා. ඊට පස්සේ සේවය තහනම් කල කෙනාගේ ලැබෙන පිළිතුර මත අපි තීරණය කරනවා විනය පරීක්ෂණයකට යනවාද නැද්ද කියලා, විනය පරීක්ෂණයට යනවා නම් අපි විනය පරීක්ෂනයක් පවත්වනවා. ස්වාධීන නිලධාරියෙක් ගෙන්වලා විනය පරීක්ෂණ පවත්වලා සාක්ෂි මෙහෙයවලා පරීක්ෂණය කරනවා. ඒ විනය පරීක්ෂනයේ තීන්දුව මත අපි තීරණය කරනවා මේ සේවකයාව සේවය අහෝසි කරනවාද නැවත සේවයට ගන්නවාද එහෙම නැත්තම් යම්කිසි දඩුවමක් දිලා ආපනු සේවයේ පිහිටුවනවා, ඒක තමයි අනේ සාමාන්‍ය ක්‍රියා පිළිවෙත.
ප්‍ර: ප්‍රනාන්දු මහතා සම්බන්ධයෙන් එවැනි ක්‍රියා මාර්ගයක් සමාගම කලාද නැද්ද?
පි: මේ මහත්මයා මූලික සාක්ෂියේදී පිළිගත්තා වගේ සමාගම මේ මහත්මයාගේ සේවය අත්හිටෙව්වා පොඩි කාලයක් ඇතුලත. ඒ හිටපු කළමණාකාරීත්වය සමාගම විකුණුවා. විකුණලා නව කළමනාකාරීත්වයක් ආවා. එතකොට මේ මහත්මයා වැඩ කරපු කාලයේ හිටපු එක අධ්‍යක්ෂකවරයෙක් විතරයි නව කළමනාකාරීත්වයට ආවේ. ඒ අධ්‍යක්ෂකතුමා දන්නේ නැහැ අභ්‍යන්තර පාලන කටයුතු දන්නේ නැහැ තේ වෙළඳාම පිළිබඳ දන්න මහත්මයෙක්. නමුත් ඇත්තටම පැහැදිලිවම වුණේ මේ මහත්මයාගේ සේවය මෙහෙම අවසාන වෙලා තිබෙනවා කියලා සමාගමේ මානව සම්පත් අංශය හෝ කිසිම තැනකට තොරතුරක් අපිට ලැබුනේ නැහැ මේ අවසාන ලිපිය එවනකල්. නිදොස් කොට නිදහස් කරලා අවුරුද්දකට පස්සේ ලිපියක් එවනකල් මේ මහත්මයා සම්බන්ධව ඇත්තටම අපිට සැහෙන අමාරුවක් වුණා මේ මහත්මයාගේ පයිල් එකක් සොයාගන්න. එම හේතුව පදනම් කරගෙන මේ මහත්මයාට එරෙහිව අර සාමාන්‍ය විනය ක්‍රියා පිළිවෙත අනුගමනය කරලා නැහැ.

ප්‍ර: ඒ කියන්නේ සමාගම අතින් යම්කිසි අඩුපාඩුවක් වුණා කියලා තමා පිළිගන්නවාද?
පි: අර හේතුව මත යම්කිසි අඩුපාඩුවක් වෙලා තිබෙනවා කියලා පිළිගන්නවා.
ප්‍ර: මේ ආයතනය සමාගම් පනත යටතේ පිහිටුවපු ආයතනයක්ද?
පි: ඔව්.
ප්‍ර: මේ ආයතනයේ ලීගල් පසනලිටි (අව්චින පැවැත්ම) කියන එක තිබෙනවාද?
පි: ඒක පිළිගන්නවා.

ප්‍ර: එහෙම නම් නෛතික පුද්ගල භාවය තිබෙන ආයතනයක අධ්‍යක්ෂක මණ්ඩලය වෙනස්වීම මත ඒකේ තිබෙන නීතිමය රාමුව වෙනස් වෙන්න විදිහක් නැහැ නේද?
පි: නීතිමය රාමුව වෙනස් වෙන්න විදිහක් නැහැ ඒක මම පිළිගන්නවා. නමුත් මම මීට ඉහතදී කිව්ව ප්‍රකාශය මත පදනම් වෙලා එහෙම අඩුපාඩුවක් තිබෙන බව පිළිගන්නවා. එහෙම නීතිමය පුද්ගලයෙක් වශයෙන් පිළිගන්නවා.
ප්‍ර. මොහු නිදොස් කොට නිදහස් වුණාට පස්සේ ඔහුගේ වයස අවුරුදු 55 සම්පූර්ණවීම නිසා ඔහුට නැවත රැකියාව ඉල්ලන්න විදිහක් නැහැ ඒ නිසා ඔහු 2014.06.26 සිට 2017.03.14 දක්වා ඒ කියන්නේ අර වැඩ තහනම් කරලා තිබුණ මුළු කාලයට අදාල වැටුප X5 ලේඛනය මගින් ඉල්ලුවා කියන කාරණය පිළිගන්නවාද?

පි: ඉල්ලුවා කියන කාරණය පිළිගන්නවා.

ප්‍ර. අන්න ඒ ලිපියට ලබාදුන් ප්‍රතිචාරය මොකක්ද?
පි: එම ලිපියට අපි ප්‍රතිචාර දක්වන්නේ මෙම මහත්මයා කිසිම සක්‍රිය සේවයකට දායක වෙලා නැහැ ඒ කාලය ඇතුලත මොකද සේවය අත්හිටුවා තිබුණ නිසා. නමුත් එම කාලයේ සම්පූර්ණ වැටුපම ඉල්ලනවා. සමාගමට යම්කිසි සැලකීමක් කරන්න පුළුවන් දෙපාර්ශවය අතර එකඟතාවයකට එනවා නම් නමුත් සම්පූර්ණ වැටුප ඉල්ලා සිටිනවා නම් ඒ පිළිබඳව සමාගම එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර සිටිනවා.

ප්‍ර. මම ඇහුවේ ඔහු සම්පූර්ණ වැටුප මිලියන දෙකයි දගම ගාණක් ඉල්ලලා ලියුමක් එව්වා ?
පි: ඔව්.

ප්‍ර. ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනවා හෝ පිළිගන්නවා කියන එක ලිඛිතව දැනුම්දීමක් කලාද මේ පුද්ගලයාට?
පි: නීතීඥ මාර්ගයෙන් එවපු ලිපියට පිළිතුරු දැක්වූවේ නැහැ. සමාගම තීරණය කලා එම ඉල්ලූ ප්‍රමාණය ඉතාමත් අධිකයි ඒ නිසා අපි ඒකට පිළිතුරක් දැක්වූවේ නැහැ.

ප්‍ර. සමාගම ඒ ඉල්ලීම ඉතාමත් අධිකයි කියලා තීන්දු කලානම් ඒ තීන්දුවවත් මේ පැමිණිලිකාර පාර්ශ්වය වෙත ලිඛිතව දන්නා යැවීමට කටයුතු කලාද

පි: එම ලිපිය නීතීඥ මාර්ගයෙන්නේ ඉල්ලීම කලේ. නීතීඥ මාර්ගයෙන් අපිට දැනුම්දීමක් කරලා තිබුණා මෙහෙම කරනවා එහෙම නැත්නම් ඔහු අධිකරණ ක්‍රියා මාර්ගයකට යනවා කියලා. ඉතින් ඔහු අධිකරණ ක්‍රියා මාර්ගයකට යනකල් බලාගෙන හිටියා එතනට ඇවිල්ලා අපි උත්තර දෙන්න.

සාක්ෂි විභාගය අතරතුර පළමු පාර්ශ්වය මෙම බේරුම්කරණ අධිකරණය වෙත මෝසමක් ඉදිරිපත් කරමින් පළමු පාර්ශ්වයට හිමිවිය යුතු මුල්‍ය සහනය පහත සඳහන් පරිදි ඉල්ලා ඇත.

1) 2014.07.24 දින සිට ඉදිරි දින 06හි වැටුප	- 6* 2,400.00	-	රු.14,400.00
2) 2014 අගෝස්තු මස සිට දෙසැම්බර් මස දක්වා වැටුප	- 5*72,000,00	-	රු.360,000.00
3) 2015 සහ 2016 වසර 02හි වැටුප	- 24* 72,000.00	-	රු.1,728,000.00
4) 2017 වසරේ ජනවාරි සහ පෙබරවාරි වසරේ මස වැටුප	- 2*72,000.00	-	රු.144,000.00
5) 2017 මාර්තු 14 වනදා දක්වා වැටුප	- 14* 2,400.00	-	රු.33,600.00
එකතුව		රු.2,280.000.00	

ප්‍රදානය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරවුලට හේතු වි පවත්නා කරුණු වනුයේ.

මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සේවය කළ ආර්. යූ. එස්. ප්‍රනාන්දු මහතාගේ සේවය විනය හේතූන් මත 2014.07.24 වෙනි දිනැති ලිපිය මගින් 2014 06.26 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීම හා ඔහුට විරුද්ධව කිසිදු විනය පරීක්ෂණයක් සිදු නොකර පත්වීම් ලිපිය ප්‍රකාරව ඔහුගේ වයස අවුරුදු 55 වන තෙක් එනම් 2017.03.14 වෙනි දින දක්වා වැටුප් නොගෙවීම මගින් ආර්. යූ. එස්. ප්‍රනාන්දු මහතාට අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.

මෙම නඩුකරයේදී ඒ ඒ පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද විස්තර ප්‍රකාශන හා සාක්ෂි විභාගය අනුව ප්‍රදානයට අදාල පහත සඳහන් වැදගත් කරුණු ආවරණය විය.

1) දෙවන පාර්ශ්වය හෙවත් මර්කන්ටයිල් ප්‍රොඩියුස් බෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පළමු පාර්ශ්වය වන ආර්. යූ. එස්.ප්‍රනාන්දු මහතාගේ සේවය පත්වීම් ලිපියෙහි කොන්දේසි ප්‍රකාරව 2014.06.26 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවා ඇත. මෙම සේවය අත්හිටු වීම අවසන් විනය නියෝගයක් වශයෙන් පිළිගත නොහැක.

2) විධිමත් අධිකරණ ක්‍රියාවලියක් අවසානයේදී පළමු පාර්ශ්වය වන ආර් යූ එස් ප්‍රනාන්දු මහතා චෝදනා වලින් නිදහස් කොට ඇත. එම තීරණයෙන් වර්ෂයකට පසු යලිත් එම තීරණය නිදොස් කොට නිදහස් කිරීමක් බවට සැලකීමට බාධාවක් නොමැත.

3) අධිකරණ නියෝගයට එරෙහිව දෙවන පාර්ශ්වයට යලිත් අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමේ හැකියාව පැවතුනත් එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට දෙවන පාර්ශ්වය අපොහොසත් වී ඇත.

4) වැඩ තහනමට ලක් කල පුද්ගලයෙකු අධිකරණ ක්‍රියාමාර්ග තුලින් නිදොස්කොට තිබියදී ඔහු වෙත එරෙහිව විධිමත් විනය ක්‍රියා මාර්ගයක් ගැනීමට දෙවන පාර්ශ්වය අපොහොසත් වී ඇත. ඒ තුලින් පළමු පාර්ශ්වය වෙත කිසියම් සාධාරණයක් ඉටුකර දීමටද දෙවන පාර්ශ්වය තවදුරටත් අපොහොසත් වී ඇත.දෙවන පාර්ශ්වය හෙවත් මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය නීතිය හමුවේ ව්‍යවස්ථාපිත සමාගමකි. එනම් නීතිමය පුද්ගලභාවය සහිත ආයතනයකි. එම සමාගමේ අයිතිය වෙනස්වීම් හෝ කළමණාකරන වෙනස්වීම හෝ අතපසු වීම් හෝ නොසලකා හැරීම් මත පැමිණිලිකාර පාර්ශ්වයට අගතියක් සිදුවිය නොහැක.

මෙම සංසිද්ධීන්ට අනුව පැමිණිලිකරු හෙවත් ආර්. යූ. එස්. ප්‍රනාන්දු මහතාගේ ඉල්ලීම සාධාරණ සහ යුක්ති සහගත බවට මෙම බේරුම්කරණ අධිකරණය පිළිගැනේ එබැවින් 2014.07.24 දින සිට 2017.03.14 දක්වා එනම් වයස අවුරුදු 55 සම්පූර්ණ වන දින දක්වා පැමිණිලිකාර පාර්ශ්වයට නියමිත වැටුප ලබා ගැනීමට හිමිකමක් ඇති බවට තීරණය කරමි. ඒ අනුව රු. 2,280,000.00 මුදල ගෙවීමේ දෙවන පාර්ශ්වය වන මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ගෙවිය යුතු බවට නියම කරමි. මෙම මුදල මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් මාසයක් ඇතුලත නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කල යුතු වේ.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට සඳහන් කරමි. ව්‍යවස්ථාපිත හිමිකම් අයදුම් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවේ.

ආචාර්ය. කේ.ඒ.තිලකරත්න,

බේරුම්කරු.

2024 ඔක්තෝබර් මස 01 වැනි දින.

EOG 11 - 0190